Article 12(1) 13(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2020-11-16

පැමිණිලි පාර්ශවය : ෆාතිමා ජස්නා සිවරාජ් මිය.
ශාන්තසෝලේ.
62, වව්නියාව.

වගඋත්තර පාර්ශවය : 01. ප්‍ර.පො.ප සම්පත් පෙරේරා මයා.
මූලස්ථාන පොලිසිය.
වව්නියාව.

02. පො.ප - ඩී.ජේ.කේ. දංගල්ල මයා.
මූලස්ථාන පොලිසිය.
වව්නියාව.

**පැමිණිලි අංකය : HRC/V/025/2019**

**පැමිණිලි පාර්ශවයේ කරුණු ඉදිරිපත් කිරීම -:**

ඉහත නම් සඳහන් පැමිණිලිකාරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා හා තම පෙම්වතා වන සිවරාජා යන අය වව්නියාව ප්‍රදේශයේ සිට මහනුවර උඩුපුස්සැල්ලාව ප්‍රදේශයට ගොස් දෙදෙනාගේ කැමැත්ත මත 2018.11.22 වන දින නීත්‍යානුකූලව විවාහ වූ බවයි. තම විවාහයට විරුද්ධව තම පියා වව්නියාව පොලිස් ස්ථානයේ කර ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් 2018.11.26 දින උඩුපුස්සැල්ලාව පොලිසියේ CIB I 122/207 යටතේ ප්‍රකාශයක් සටහන් කළ බවත් එම ප්‍රකාශය උඩපුස්සැල්ලාව පොලිසිය විසින් වව්නියාව පොලිසිය වෙත ෆැක්ස් කර ඇති බවත්ය. එසේ තිබියදී තම සැමියා වන සිවරාජා යන අයව අසත්‍ය පැමිණිල්ලක් මත 2019.02.10 වන දින වව්නියාව පොලිසිය විසින් අත්අඩංගුවට ගත් බවත්ය.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**වගඋත්තරකරුගේ ස්ථාවරය -:**

වව්නියාව පොලිස් ස්ථානය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2019.02.02 දිනැති වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එම වාර්තාව අනුව වව්නියාව, පට්ටානිපුර, 03 වන පටුමග අංක 11 දරණ නිවසේ ඒ.එම්. අසාර් යන අය විසින් තම දියණිය පැහැරගෙන යාමක් සම්බන්ධව 2018.12.11 දින කරනු ලැබූ පැමිණිල්ලක් මත අත්අඩංගුවට ගැනීමක් කර අධිකරණය වෙත ඉදිරිපත් කළ බවයි.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු**

පැමිණිලිකාරිය වන ෆාතිමා ජස්නා හා සිවරාජා යන අය ප්‍රේම සම්බන්ධතාවයක් පවත්වා ගෙන ගොස් ඇති අතර, මෙම සිවරාජ් යන අය පැමිණිලිකාරිය වන ෆාතිමා ජස්නාගේ පියා වන ඒ.එම්. අසාර් යන අයගේ වෙළඳසැලේ සේවකයෙකු වන බවත්, මොවුන් දෙදෙනා වව්නියාව සිට මහනුවර ප්‍රදේශයට ගොස් 2018.11.22 දින නීත්‍යානුකූලව විවාහ වී ඇති බවත් අනාවරණය වී ඇත. තම දියණිය තම වෙළඳසැලේ සේවකයෙකු සමග ගොස් විවාහ වීම පිළිබඳව ඒ.එම්. අසාර් යන අය වව්නියාව පොලිසිය වෙත ගොස් තම දියණිය පැහැරගෙන ගිය බව පවසා පැමිණිල්ලක් ගොනු කර ඇති අතර, එම පැමිණිල්ල ගොනු කර ඇත්තේ, 2018.12.11 දින බවත්, 2018.12.12 දින වව්නියාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත බී/2298/18 යටතේ කරුණු වාර්තා කර ඇති බවත් අනාවරණය වේ. මෙම පැමිණිලිකාරිය හා ඇයගේ පෙම්වතා වන සිවරාජ් යන අය නීත්‍යානුකූල විවාහ වන අවස්ථාවේදී වයස අවුරුදු 18 ඉක්මවා සිට ඇති අතර, ඔවුන්ගේ විවාහට නීතිමය බාධාවක් සිදුව නොමැත.

මෙහිදී ඔවුන් දෙදෙනා නිවසින් ගොස් විවාහ වීම සම්බන්ධව කරුණු වැරදි ලෙස සඳහන් කරමින් තම දියණිය පැහැරගෙන යාමක් සිදු කර ඇති බවට 2018.12.11 දින කර ඇති පැමිණිල්ල සම්බන්ධව වගඋත්තරකාර නිලධාරීන් විමර්ශනයක් සිදු කර නොමැති බව මේ අනුව නිරීක්ෂණය වේ. මන්ද මොවුන් අතර පැවති ප්‍රේමසම්බන්ධතාවය පිළිබඳව මීට ඉහත දීද පොලිසිය වෙත පැමිණිලි ලැබී එය විමර්ශනය කර සමථ කර ඇති බැවිනි. තවද පැමිණිලිකාරිය හා අදාල චූදිත විසින් 2018.11.26 දින උඩුපුස්සැල්ලාව පොලිස් ස්ථානය වෙත ගොස් ප්‍රකාශයක් ලබාදී තිබෙන අතර, එම ප්‍රකාශය එම අවසථාවේදීම වව්නියාව පොලිස් ස්ථානය වෙත ෆැක්ස් මගින් යොමු කර ඇත. එය වව්නියාව පොලිස් ස්ථානයේ උධෘත පොත්වල සටහන් (අලවා) තිබෙන බවට කොමිෂන් සභාවෙන්ද නිරීක්ෂනය කර ඇත. තවද පැමිණිලිකාරිය හා සිවරාජ් යන අය උඩුපුස්සැල්ලාව පොලිස් ස්ථානය වෙත ප්‍රකාශ ලබා දෙන්නේ 2018.11.26 දින වන අතර, එම ප්‍රකාශය ලබා දෙන්නේ වව්නියාව පොලිස් ස්ථානය වෙත පැමිණිලිකාරියගේ පියා කරනු ලැබූ

පැමිණිල්ල සම්බන්ධයෙන් වව්නියාව පොලිස් ස්ථානය විසින් උඩුපුස්සැල්ලාව පොලිසියට කරනු ලැබූ දැනුම්දීම මතයි. නමුත් වව්නියාව පොලිස් ස්ථානයේ පොත්පත්වල පැමිණිල්ල පිළිබඳ සටහන් යොදා ඇත්තේ 2018.12.11 දින වන අතර එයින් ගම්‍ය වන්නේ නීත්‍යානුකූලව පැමිණිල්ලක් ලබා නොගෙන පැමිණිලිකාරියගේ පියාගේ හා 01 වන වගඋත්තරකරුගේ අවශ්‍යතාවයට අනුව විමර්ශනය සිදුව ඇති බවයි.

තවද අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමේදී ද එවකට අනාවරණය වී තිබූ තොරතුරු බී වාර්තාවට ඇතුලත් කිරීමක් සිදුකර නොමැති බවද අනාවරණය වී ඇත. ඒ අනුව ඉහත වගඋත්තරකරුවන් විසින් නීතිය ක්‍රියාත්මක කිරීම සාධාරණ ලෙස ඉටු කර නොමැති අතරම පක්ෂග්‍රාහීව කටයුතු කර ඇති බවට තීරණය කිරීම සඳහා ප්‍රමාණවත් කරුණු අනාවරණය වේ.

**නිගමනය -:**

මෙම සමස්ත කරුණු අනුව ඉහත වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් 12(1) හා 13(1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. නිසි විමර්ශනයකින් තොරව වගඋත්තර පාර්ශවය විසින් සිවරාජා යන අයව අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බැවින් අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද වව්නියාව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් මෙහි පැමිණිලි පාර්ශවය වෙත රු. ක මුදලක් ගෙවීමට කටයුතු කළ යුතුය.

02. තවද වව්නියාව පොලිස් ස්ථානය මගින් පැමිණිල්ල නීත්‍යානුකූලව භාරනොගෙන විමර්ශන පවත්වාගෙන ගොස් තිබීම සම්බන්ධයෙන්ද සුදුසු පියවර ගැනීම සඳහා මෙම පැමිණිල්ලේ පිටපතක් පොලිස්පති වෙතද යොමු කරනු ලැබේ.

2020. 12 - 15 . වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

රමණි මුත්තෙට්ටුවේගම.
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**නො 14, ආර්.ඒ. ද මෑල් මාවත,**
**කොළඹ 04.**

පිටපත :- පොලිස්පතිතුමා.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

සැ.යු - අදාල මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපත් කොමිෂන් සභාවට ලැබීමට සැලස්විය යුතුය.

B/R